# මගෙ සුරතල්

# බලු පැටියා



රනුදි නෙතුම්සා ධර්මසේන

# මගෙ සුරතල් බලු පැටියා

රනුදි නෙතුම්සා ධර්මසේන

**ISBN 978-624-208-115-1**

කෘතිය පළ කරන දිනය - 12.12.2023

කතෘගේ වෙනත් කෘති - නැතිවුණු කිටි පැටියා

# පිදුම

කෘතිය ලියන්නට මා දිරිමත් කල

ආදරණීය අප්පච්චී අම්මා හා අක්කාට

සහ මට මඟ පෙන්වූ

ආදරණීය ගුරු තුමියන් වූ

මංජුලා විජේකෝන් ගුරු තුවියට හා

සමන්මලී ගුරු තුමියටත්

සෙනෙහසින් පිළිගන්වමි …….

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත් වන පවුලක් මෙන්ම ප්‍රඥා සම්පන්න දැනුමෙන් යුත් බහු විධ කුසලතා වන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභලතා හඳුනාගෙන ඒවා ඔපලත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුල ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැලපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත් කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශය අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරතවයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිතය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කල 'දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකල විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කල සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධිර


විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023.11.01

## මගෙ සුරතල් බලු පැටියා

දවසක් අම්මයි අප්පච්චියි අක්කයි මමයි කොත්මලේ යන්න පිටත් වුණා.අපි යන අතර මඟදී පාර මාරුවන පුංචි බලු පැටියෙක් දුටුවා අප්පච්චි එක පාරම අපි ගිය කාරය නැවත්වුවා  මම කාරයෙන් බැහැලා බලු පැටියව වඩා ගත්තා



පස්සේ මමයි අක්කයි බලුපැටියව කාරයට දාගෙන ආයෙම අපේ ගමන යන්න පිටත්වුණා. අපි හවස තුන වෙද්දී කොත්මලයට ගියා. අපි ගියේ අපෙ කිරිඅම්මලාගේ ගෙදර.

අපි එහෙ ගිය ගමන්ම බලු පැටියට කිරි හදලා දුන්නා කෑමත් දුන්නා ඊට පස්සේ අපි කාඩ්බෝඩ් පෙට්ටියක් අරන් ඌට කූඩුවක් හැදුවා.ඊට පස්සේ අපි ඌව කූඩුව ඇතුලට දාලා කෑමයි වතුරයි තිබ්බා

අපි නිදාගන්න හදනකොට ඌ කෑගහන හඬ මට ඇසුනා. මම නැඟිටලා ගිහින් ඌ එළියට ගත්තා.ගෙදර ඇතුලෙම ඌට ඉන්න අපි හදලා දුන්නා

පසුවෙනිදාම අපි ආපහු අපේ ගෙදර එන්න පිටත්වුනා.එන අතර මඟදී බිස්කට් විස්කෝතු වගේ දේවල් ඌට කන්නත් දුන්නා

අපි ගෙදර ඇවිත් කූඩුවක් හදලා බලු පැටියා ඒකට දැම්මා ඒත් ඌ ඒ කූඩුවේ ඉන්න කැමති බවක් පෙනුන් නැහැ

අපි බලු පැටියට නමක් දැම්මා ඒ නම නම් දැම්මෙ අක්කා. උගේ නම තමා ප්ලාෆි. ඉතින් එයා දැන් අපේ පවුලේ සාමාජිකයෙක්. අපි බලු පැටියට ගොඩක් ආදරෙයි

ඌ දැන් නිදාගන්නෙත් අපේ ගේ ඇතුලෙමයි දැන් ඌ ටිකෙන් ටික ලොකු වෙනවා. මම ඉස්කෝලෙ

යනකොට උෟ ගේට්ටුව ළඟට ඇවිත් දුකින් වගේ බලා ඉන්නවා. මම ආපහු ගෙදර එන වෙලාවටත උෟ ගේට්ටුව ළඟ ඉන්නවා හොරෙන්ම ඇවිත් මගෙ ඇඟටත් පනිනවා. මම අම්මා එක්ක උෟව සතියකට සැරයක් නාවනවා. නාවන වෙලාවට දම්වැල දාන්නේ පුදුම අමාරුවෙන්.




අපි උෟ නැව්වට පස්සේ සීතලේ වෙව්ලනවා.ඒ වෙලාවට අපි උෟට කිරි හදලා දෙනවා. කන්නත් දෙනවා.

දවසක් උෟ අසනීපවෙලා.ගෙදර හිටියෙ අක්කයි මායි කිරි අම්මයි විතරමයි. දැන් මොකද කරන්නේ. අපි බයවුණා. අප්පච්චිට කෝල් කලා ඒත් එයා කතා කලේ නැහ.

පස්සේ අපි තුන්දෙනා ( අක්කයි මායි කිරි අම්මයි ) ගෙවල් ළඟ තිබුණු ත්‍රීවිලර් එකක පිළිමතලාවේ පශුවෛද්‍ය අංකල් හොයාගෙන ගියා.එයා හිටියේ නැහ.අපි ගෙදර එන කොටම අප්පච්චිත් ආවා. අපි ප්ලොෆිව පේරාදෙණියේ පශු වෛද්‍ය රෝහලට ගෙන ගියා.

උෟ ලොම් ගොඩක් තියන පොමනේරියන් වර්ගයට අයත් බලු පැටියෙක්. උගේ ප්‍රියතම ආහාරය බත් සමඟ මාළු.

අපිට දවසක් කුරුණෑගල ලොකු අම්මලගේ ගෙදර යන්න හිතුවා ඒත් මගේ බලු පැටියව තනියෙන් ගෙදර දාල යන්න වෙන නිසා මමගමන යන්න අකැමැති වුනා ඒත් ඒකට අපි පොඩි උපායක් කල්පනා කලා පොඩි කාඩ්බෝඩ් පෙට්ටියක එයාව දාලා අරගෙන යන්න

ඉතිං අපි පොඩි පෙට්ටියක් හොයිගෙන උෟව දාගෙන කාර්එකේ පිටිපස්සේ තියාගෙන ගියා.උෟ ගියේ හරිම ආසාවෙන් ටික දුරක් යද්දී උෟ පෙට්ටියෙන් එළියට ඇවිත් ජනේලය අයිනට එන්නහදනවා මම උෟට එන්න ඉඩ දුන්නාම උෟ ජනේලය අයිනට ඇවිත් පාර අයිනෙ වටාපිටාව බලබල යන්න වුණා

අපි එහෙට ගියාට පස්සේ එහෙ ගෙදර ඉන්න බල්ලා අපේ ප්ලොෆියව හපන්න ආවා අපි උෟව කාමරයකට දාලා ආරක්ෂාකලා

ටික වෙලාවක් ගියාට පස්සේ එහෙ බල්ලත් එක්ක ප්ලාෆියව යාළුවෙලා ඉන්නව මම දැක්කා අපි ඒ බලු පැටවු දෙන්නටම බත් දුන්නා.

ඊට පස්සේ ඒ දෙනනම හොදට නිදාගත්තා. පහුවෙදා අපි ආයෙම අපේ ගෙදර ආවා.

ඔහොම ඉන්නකොට අපෙ ප්ලාෆියගේ අවුරුද්දත් සම්පූර්ණ වුනා.අපි කේක් එකක් ගෙනල්ලා උගෙ උපන් දිනය සැමරුවා. අපි ගෙනාපු කේක් උෟට කැව්වා.



අපි ප්ලාෆියට හප හප ඉන්න රබර් මස් කටීටකුයි ලස්සන බෙල්ට් එකකුයි ගෙනත් දුන්නා.අපි එයාට දුන්නේ එයා ආසම රතු පාට බෙල්ට් එකක්. ප්ලොෆිට රතු පාට  බෙල්ට් එක හරිම ලස්සනට තිබ්බා.ඊට පස්සේ දවසේ අපි ඉස්කොලේ ගියා.අම්මයි අප්පච්චියි වැඩට ගියා. එතකොට ප්ලොෆි හිටියේ කිරි අම්මයි කිරි අත්තයි එක්ක.අපි හැමෝම ප්ලාෆිට ආදරෙයි.

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම, ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාතයාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පරියේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුල ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වු මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යපනගේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනගේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග ඔැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023.11.01